# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | **இணைந்த சேவைகள் பிரிவு** | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:**(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்:**(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site


---

මගේ අංකය / எனது இல / My No: COM/Trans/V/වා.ස්.මා./2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.08.09

සියලු අමාත්‍යාංශ/රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු
දිස්ත්‍රික් ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරු

## <u>ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022</u>

මගේ සමාංක හා 2021.08.06 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2021 හා 2021.08.06 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛය මඟින් ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු නිවේදනය www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

02. එමඟින් ඔබ වෙත දැනුම් දී ඇති පරිදි ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු නිවේදනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු එනම්, **2021.08.09 සිට 2021.12.31 දක්වා වූ කාලසීමාව තුළ දී සාමාන්‍ය හා සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා නොබලන බව කාරුණිකව දන්වා සිටිමි.**

03. තවද 2022.06.30 දිනට හෝ ඊට පෙර ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවාකාලය වසර 05 සම්පූර්ණ කරන ඒකාබද්ධ සේවයේ සියළු නිලධරයන් 2022 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කළ යුතු අතර **ඔවුන්ගේ සාමාන්‍ය හෝ සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ද සලකා නොබලන බව වැඩිදුරටත් දන්වා සිටිමි.**

04. එමෙන්ම ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ 2021 වාර්ෂික ස්ථාන මාරු නියෝග අදාළ දිනයන්හි නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතු අතර නියමිත දින ඉක්මවා මෙතෙක් ක්‍රියාත්මක නොවූ 2021 වාර්ෂික ස්ථාන මාරු නියෝගද කඩිනමින් ක්‍රියාත්මක කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

05. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාලවල සේවය කරන සියලුම ඒකාබද්ධ සේවයේ නිලධරයන් දැනුවත් කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්